# 2013 වර්ෂය සඳහා මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය මුල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ කාර්යසාධන වාර්තාව

# පටුන


| | | පිටුව |
|---|---|---|
| 1. | දැක්ම හා මෙහෙවර ප්‍රකාශය | 03 |
| 2. | කාර්යයන් | 04 |
| 3. | රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියෙහි ක්‍රියාකාරිත්වය - 2013 | 05 |
| 4. | 2013 වර්ෂයේ කාර්යසාධනය | 15 |
| 5. | පාලන හා ගිණුම් | 22 |

# දැක්ම

තිරසාර රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියක්

ස්ථාපිතවීම සහතික කිරීම

# මෙහෙවර

රජයේ පුළුල් සංවර්ධන ක්‍රියා රාමුව තුළ

රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය

සම්පාදනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම

# කාර්යයන්

- පෞද්ගලික, රාජ්‍ය සහ ජාත්‍යන්තර නියෝජිතයන් සම්බන්ධීකරණය කරමින් මැදිකාලීන අයවැය රාමුවක් තුළ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය සම්පාදනය කිරීම,

- බදු ප්‍රතිපත්ති සහ ඊට අදාළ අනෙකුත් අණ පනත් සකස් කිරීම, (තීරු බදු සහ විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද හැර)

- රාජ්‍ය ආදායම් සහ ලැබීම් ඇතුළත්ව රාජ්‍ය මූල්‍ය පෙළගැස්ම සහ රාජ්‍ය මූල්‍ය ක්‍රියාකාරිත්වය කළමනාකරණය සහ නිරීක්ෂණය,

- සියලුම වාර්තාකරණයන් ඇතුළත්ව රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනත ක්‍රියාත්මක කිරීම

## 1. රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියෙහි ක්‍රියාකාරිත්වය - 2013

අයවැය ලේඛනය සමඟ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ වාර්ෂික රාජ්‍ය මූල්‍ය කළමනාකරණ වාර්තාවේ මධ්‍ය කාලීන සාර්ව රාජ්‍ය මූල්‍ය රාමුව තුල පැහැදිලි කර ඇති පරිදි රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය ඇති කිරීම සඳහා වූ දැඩි උත්සාහය හේතු කොට ගෙන අඛණ්ඩව සිව්වන වරටත් 2013 වර්ෂයේ දී අයවැය හිඟය තවදුරටත් අඩු වී ඇත. 2009 වර්ෂයේ දී ද.දේ.නි. ප්‍රතිශතයක් වශයෙන් සියයට 9.9 ක් වූ අයවැය හිඟය 2010 වර්ෂයේ දී සියයට 8.0 ක්ද 2011 වර්ෂයේ දී සියයට 6.9 ක්ද 2012 වර්ෂයේ දී සියයට 6.5 ක්ද 2013 වර්ෂයේ දී සියයට 5.9 ක්ද වශයෙන් අඩුවීමක් පෙන්නුම් කරයි. රාජ්‍ය ආදායමෙහි ප්‍රවණතාවයත් සමඟ අනුකුලවන පරිදි රාජ්‍ය වියදම පවත්වා ගැනීමට දරන ලද උත්සාහයේ ප්‍රතිඵලයක් වශයෙන් අයවැය හිඟයේ මෙම ක්‍රමික අඩුවීම සිදුවී ඇත. මේ අනුව 2009 සිට 2013 දක්වා රජයේ ආදායම රු. බිලියන 696.6 සිට රු. බිලියන 1,137.4 දක්වා වැඩි වී ඇති අතර රජයේ වියදම ද රු. බිලියන 1,202 සිට රු. බිලියන 1,699.4 දක්වා වැඩි වී ඇත. 2009 වර්ෂයේ සිට ආදායම් වර්ධනයේ නාමික අගයේ සාමාන්‍යය සියයට 11.8 ක් හා රාජ්‍ය වියදම් වර්ධනයේ සාමාන්‍යය අගය සියයට 11.0 ක් වූ අතර මෙම ආදායම් හා වියදම් වර්ධනය ද.දේ.නිෂ්පාදිතයේ නාමික වර්ධනයට වඩා අඩු අගයක් දරයි. මෙම තත්ත්වය රාජ්‍ය මූල්‍ය අසමතුලිතතාවයන් අවම කිරීමට උපකාර වෙමින් ඉහත පෙන්නුම් කළ ආකාරයට රාජ්‍ය ආදායම් වර්ධනය ද.දේ.නිෂ්පාදිතයේ නාමික වර්ධනයට වඩා පසුගාමිත්වයක් පෙන්නුම් කරන අතරම ද.දේ.නිෂ්පාදිතයෙන් සියයට 5.5 ට වඩා වැඩි රාජ්‍ය ආයෝජනයක් පවත්වා ගැනීම වෙනුවෙන් රාජ්‍ය ආදායම ප්‍රමාණවත් නොවන බව තහවුරු කරයි. රාජ්‍ය ආයෝජනය ණය ලබා ගැනීම මඟින් මූල්‍යනය කිරීම අඩු කිරීම සඳහා රාජ්‍ය ආදායම ශක්තිමත් කිරීමේ අවශ්‍යතාවය මෙමගින් තව දුරටත් ඉස්මතු කොට දක්වයි. අයවැය හිඟයේ තිරසාර අඩු වීමට අමතරව ආදායමේ සහ පුනරාවර්තන වියදම්හි ක්‍රියාකාරිත්වය හේතුවෙන් ආදායම් හිඟය රු. බිලියන 67.7 ක් හා ප්‍රාථමික හිඟය රු. බිලියන 72.1 ක් ලෙස තවදුරටත් අඩු කිරීමට සමත්ව ඇත. මෙම අගයන් දෙකම ද.දේ.නිෂ්පාදිතයෙන් සියයට 0.8 ක පමණ ප්‍රතිශතයක් දරන ලදී.

2013 වර්ෂයේ දී සමස්ත රාජ්‍ය මූල්‍ය කටයුතු මෙහෙයවීමේදී තවදුරටත් අභියෝග රැසකට මුහුණ දෙන ලදී. ආනයන මත වන බදු ආදායමේ පසුබෑම, අඩු බදු අනුපාත සඳහා තවදුරටත් කරනු ලැබූ සංශෝධන, පුළුල් බදු පදනමක් සහිත බදු ක්‍රමයක් ඇති කිරීමට ගන්නා ලද උත්සාහය හා වේගයෙන් පුළුල් වන සේවා අංශයට සම්බන්ධව බදු පරිපාලනයේ දී පැවති අභියෝග යනාදිය හේතුවෙන් වර්ෂයේ මුල් භාගය තුළ ආදායමෙහි අසමතුලිත ලක්ෂණ දක්නට ලැබුණි. නව වර්ෂය සඳහා කරනු ලැබූ වැටුප් සංශෝධන හා ණය සේවාකරණ ගෙවීම් වර්ෂය මුලට ඒක්රැස් වීම පළමු මාස හතර තුළ වියදම ඉහළ යාමට හේතු විය. කෙසේ වෙතත් ආදායමේ වර්ධනයත් රාජ්‍ය වියදම් කළමනාකරණයේ තවදුරටත් සිදුවූ වර්ධනයත් සමග වර්ෂයේ දෙවන භාගය වන විට මෙය සමනය විය.

රජයේ ආදායම් ක්‍රියාකාරිත්වයේ වර්ධනයක් පෙන්නුම් කළ ද අපනයනවල අඩු වීමත් ඉකුත් වර්ෂයේ සිට 2013 වර්ෂයේ මුල් භාගය දක්වා දේශීය ආර්ථික කටයුතුවල මඳ පසුබෑමත්, නිෂ්පාදනය දිරිමත් කිරීම සඳහා තෝරාගත් අංශ සඳහා බදු නිදහස් කිරීම් හා බදු සහන ලබාදීමත් නිසා රජයේ ආදයමේ ඉලක්කගත අගය වන රු. බිලියන 1,257.6 ට ලඟාවීමට අපොහොසත් වී ඇත. වර්ෂයේ මුල් භාගය තුළදී අඩු වීමක් පෙන්නුම් කළ ආදායම් රැස් කිරීම අනතුරුව වර්ෂය අවසානය දක්වා ධනාත්මක වර්ධනයක් පෙන්නුම් කර ඇත. වරාය හා ගුවන්තොටුපල සංවර්ධන බදු (PAL) සහ ආර්ථික සේවා ගාස්තු (ESC) හැර අනෙකුත් ප්‍රධාන බදු වර්ග වලින් ලද ධණාත්මක දායකත්වය 2013 වර්ෂයේ දී බදු ආදායම සියයට 10.7 ක වර්ධනයක් ලබා ගැනීමට හේතු වී ඇති අතර එය 2011 දී හඳුන්වා දෙනු ලැබූ බදු ප්‍රතිසංස්කරණ නිසා වූ දිරිමත්වීමක් ලෙස සැලකිය හැකිය. ද.දේ.නි. ප්‍රතිශතයක් ලෙස 2012 වර්ෂයේ දී වාර්තා කළ සියයට 12.0 ක් වූ බදු ආදායමට සාපේක්ෂව 2013 බදු ආදායම සියයට 11.6 ක් විය.

අඩු බදු අනුපාත සහ පුළුල් බදු පදනමක් අරමුණු කරගත් නව බදු ප්‍රතිසංස්කරණවල ප්‍රතිඵලයක් වශයෙන් 2013 වර්ෂයේ දී විශේෂයෙන්ම වර්ෂයේ දෙවන භාගය තුළදී ආදායම් ක්‍රියාකාරිත්වය යහපත් ප්‍රවණතාවයක් පෙන්නුම් කරන ලද අතර එම තත්ත්වය මගින් බදු ප්‍රතිසංස්කරණවලින් අපේක්ෂිත ප්‍රතිඵල ලබා දීම අරඹා ඇති බව පිළිබිඹු විය. විශේෂයෙන්ම, ආදායම් බදු ක්‍රියාකාරීත්වය දිරිගන්වන සුළු විය. බදු පදනම පුළුල් කර ගැනීම මගින් එකතු කළ අගය මත බදු හා ජාතිය ගොඩනැගීමේ බදු ආදායම ද ක්‍රමයෙන් ඉහළ යමින් පැවතිණ. ආනයන පාදක කොට ගත් බදු ආදායමේ අඩු කාර්ය සාධනයක් තවමත් දැකිය හැකිය. මෙම තත්ත්වය අනාගතයේ දී ජාත්‍යන්තර වෙළඳාමට සම්බන්ධ ඉදිරි බදු ක්‍රියාමාර්ගවල දී බදු අනුපාත තවදුරටත් ලිහිල් විය හැකි බව හා දේශීය ආර්ථික කටයුතුවල වර්ධනය සැලකිල්ලට ගෙන දේශීය බදු ආදායම, විශේෂයෙන් සේවා අංශයෙන් ලබන බදු ආදායම වැඩිකර ගැනීම සඳහා සාමූහික උත්සාහයක් දැරීමේ අවශ්‍යතාව ඉස්මතු කොට දක්වයි.

2012 වර්ෂයේ වූ රු. බිලියන 408 ට සාපේක්ෂව රජයේ පොලී වියදම රු. බිලියන 444 ක් දක්වා සියයට 8.7 කින් පමණක් වැඩි වී ඇති අතර සාපේක්ෂව අඩු වෙළෙඳපොල පොලී අනුපාත සහ මුළු දේශීය ණය ප්‍රමාණයෙන් කෙටි කාලීන ණය ප්‍රමාණය අඩු කිරීමට ගනු ලැබූ ක්‍රියාමාර්ග මේ සඳහා හේතු වී ඇත. කෙසේ වෙතත් 2009 වර්ෂයේ දී ද.දේ.නි. යෙන් සියයට 3.9 ක්ව පැවති ජාතික ආරක්ෂාව සඳහා වන වියදම රටේ පවතින සාමකාමී වාතාවරණය හේතුවෙන් ද.දේ.නි. යෙන් සියයට 2.4 දක්වා අඩුකර ගැනීමට හැකිවීමත් වෙනත් භාණ්ඩ හා සේවා සඳහා වන වියදම පෙර වර්ෂයේ පැවති රු. බිලියන 140 (ද.දේ.නි. යෙන් සියයට 1.8) සිට රු. බිලියන 119.4 (ද.දේ.නි. යෙන් සියයට 1.4) දක්වා අඩුකර ගැනීමට හැකි වීමත් හේතුවෙන් ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් වශයෙන් පොලී නොවන පුනරාවර්තන වියදම් 2012 වර්ෂයේ වාර්තා කළ සියයට 9.5 ට සාපේක්ෂව 2013 වර්ෂයේ දී සියයට 8.8 දක්වා අඩු වී ඇත. මෙමගින් පෙර වර්ෂයේ දී ද.දේ.නි. ප්‍රතිශතයක් වශයෙන් සියයට 14.9 ක්ව පැවති පුනරාවර්තන වියදම් 2013 වර්ෂයේ දී සියයට 13.9 ක පවත්වා

ගැනීමට හැකියාව ලැබී ඇත. 2012 වර්ෂයේ දී ද.දේ.නි. යෙන් සියයට 1.0 ක්ව පැවති ආදායම් හිඟය 2013 වර්ෂයේ දී සියයට 0.8 ක් වී ඇති අතර මෙම ආදායම් හිඟය වර්ෂය සඳහා අපේක්ෂිත මට්ටමේ පවත්වා ගනු ලැබූ අතර රාජ්‍ය ආයෝජන අපේක්ෂිත ඉලක්කය වූ රු. බිලියන 529.3 ට (ද.දේ.නි. යෙන් සියයට 6.1) සාපේක්ෂව රු. බිලියන 481.2 ක (ද.දේ.නි. යෙන් සියයට 5.5) මට්ටමේ පවත්වා ගෙන අයවැය හිඟය අපේක්ෂා කළ මට්ටමේ පවත්වා ගැනීමට හැකිවිය.

පුනරාවර්තන වියදම් වඩාත් තාර්කිකරණය කිරීමට අඛණ්ඩව ගන්නා ලද උත්සාහයන් මෑත කාලීනව ඇති වූ ආදායමෙහි හිඟයන්ට මුහුණ දීම සඳහා අයවැය තුළ කැපී පෙනෙන ඉඩක් ලබා දී ඇත. මෙය විශේෂයෙන් 2011 සිට හඳුන්වා දුන් බදු ප්‍රතිපත්තිවලට පසුව රාජ්‍ය මූල්‍ය මෙහෙයුම් මත වන පීඩනය සැලකිය යුතු මට්ටමකින් අඩු කිරීමට හේතු වී ඇත.

සාර්ව ආර්ථික පෙර දැක්ම තුළ ඇති විය හැකි විවිධ අසමතුලිතතාවයන්ට මුහුණදීම සඳහා වර්ෂය තුළ ප්‍රතිපත්තිමය වෙනස්කම් කිහිපයක් හඳුන්වා දෙන ලදී. ජාත්‍යන්තර තෙල් මිල ගණන් ඉහළයාම හේතුවෙන් ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවට හා ලංකා විදුලිබල මණ්ඩලයට සිදු වූ මූල්‍ය අලාභ අඩු කිරීම සඳහා ඛණිජ තෙල් මිල හා විදුලි බිල සංශෝධනයට ලක් කිරීම, විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද (SCL) සංශෝධනය කිරීම හා දේශීයව අගය එකතු කළ නිෂ්පාදන දිරිමත් කිරීම සඳහා ආනයනික භාණ්ඩ කිහිපයක් මත වූ සෙස් බදු සංශෝධනය කිරීම මේ අතුරින් ප්‍රධාන ක්‍රියාමාර්ග ලෙස හැඳින්විය හැකිය. වර්ෂය තුළ සැර මද්‍යසාර හා ධාන්‍ය මද්‍යසාර සඳහා වන නිෂ්පාදන බදු හා දුම් වැටි සඳහා වන නිෂ්පාදන බදු වැඩි කිරීම මඟින් ඉහළ ආදායම් මට්ටමක් පවත්වාගෙන යාමට හැකි විය. මෙයට අමතරව ඕනෑම දිවුරුම් ප්‍රකාශයක් සඳහා වන මුද්දර ගාස්තු අඩුකර ඇති අතර ශ්‍රී ලංකාවේ අපනයන ශක්තිමත් කිරීමේ අරමුණින් අක්වෙරළ වෙළඳ කටයුතු සඳහා හඳුනාගත් ස්ථාන නිදහස් වරායන් හා බන්ධිත ප්‍රදේශ ලෙස මුදල් පනත යටතේ 2013 අංක 1 දරන වාණිජ කේන්ද්‍රස්ථාන රෙගුලාසි මඟින් ප්‍රකාශයට පත්කරන ලදී.

2013 වර්ෂයේ දී වර්තන වියදම රු.බිලියන 1,205 ක් වූ අතර 2012 වර්ෂය හා සැසඳීමේ දී එය සියයට 6.6 ක වැඩිවීමකි. 2012 වර්ෂයේ දී රු.බිලියන 408 ක් වූ රාජ්‍ය පොලි වියදම 2013 වර්ෂයේ දී රු.බිලියන 444 ක් වූ අතර එය මුළු වර්තන වියදමින් සියයට 37 ක් විය. කෙසේ වෙතත්, ද.දේ.නි. ප්‍රතිශතයක් වශයෙන් පසුගිය වර්ෂයේ දී සියයට 5.4 ක් වූ එය මෙම වර්ෂයේ දී සියයට 5.1 ක් දක්වා පහළ ගියේය. දේශීය පොලී ගෙවීම සියයට 8 කින් ඉහළ ගිය අතර, විදේශීය පොලී ගෙවීම් සියයට 11.2 කින් ඉහළ ගියේය. පොලී වියදමින් රු.බිලියන 343 ක් දේශීය පොලී ගෙවීම් වන අතර එය මුළු වර්තන වියදමින් තුනෙන් එකකි.

පොලී නොවන වර්තන වියදම 2012 වර්ෂයේ රු.බිලියන 723 හා සැසඳීමේ දී මෙම වර්ෂයේ රු.බිලියන 76 ක් වූ අතර එය සියයට 5.3 ක ඉහළ යාමක් වූ අතර දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 8.8 කි. තවදුරටත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම තුළින් වැටුප් පිරිවැය ඉහළයාම

හේතුවෙන් රාජ්‍ය සේවයේ වැටුප් වියදම රු.බිලියන 348 සිට රු.බිලියන 393 දක්වා සියයට 13.1 කින් ඉහළ ගියේය. විශ්‍රාමිකයින් සඳහා ලබා දෙන මාසික දීමනාව රු. 500 කින් වැඩි කිරීම සහ 2012 වර්ෂයේ දී විශ්‍රාම ගිය රජයේ සේවකයින් 16,794 කගේ මුළු බලපෑම සහ 2013 වර්ෂයේ දී රජයේ සේවකයින් 22,111 දෙනෙකු ද විශ්‍රාම වැටුප් ප්‍රතිලාභීන් ලෙස අලුතින් එකතුවීමේ ආන්තික බලපෑමෙහි ප්‍රතිඵලයක් වශයෙන් 2013 වර්ෂයේ දී විශ්‍රාම වැටුප් වියදම රු.බිලියන 123 ක් දක්වා සියයට 10.4 කින් ඉහළ ගියේය.

මේ අතර රජය විසින් අඛණ්ඩව ක්‍රියාත්මක කරනු ලබන ප්‍රධාන සමාජ සුභ සාධන වැඩසටහන් වියදම 2013 වර්ෂයේ දී රු.බිලියන 52.3 ක් වූ අතර එයින් රු.බිලියන 16.2 ක් ආබාධිත රණවිරුවන් සඳහා ද, රු.බිලියන 15.3 ක් සමෘද්ධිලාභීන් සඳහා ද රු.බිලියන 7.7 ක් පාසල් නිළ ඇඳුම්, පෙළපොත් සහ පෝෂණ වැඩසටහන් සඳහා සහ රු.බිලියන 13.1 ක් සහන ලැබිය යුතු සමාජයේ විවිධ ජන කොටස් සඳහා සහන ලබාදීමට සහ අනිකුත් සමාජ සුභසාධන කටයුතු සඳහා ද වැය කරන ලදී. තවද ප්‍රධාන වශයෙන් වැටුප් හා වේතන ගෙවීම් වැඩිවීම හේතුවෙන් රාජ්‍ය ආයතන සඳහා රු.බිලියන 39.4 ක් ප්‍රදානය කරන ලද අතර රු.බිලියන 13.9 ක් ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව, තැපැල් දෙපාර්තමේන්තුව සහ ලංකා ගමනාගමන මණ්ඩලය යන ආයතනවල මෙහෙයුම් අලාභ පියවීම සඳහා ලබාදෙන ලදී. රාජ්‍ය මූල්‍ය කටයුතු ශක්තිමත් කිරීම සඳහා රජයේ වියදම් වඩාත් තාර්කිකරණය කිරීම සඳහා ඇති රජයේ කැපවීමෙහි ප්‍රතිඵලයක් වශයෙන් පසුගිය වර්ෂයේ දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිඵලයක් වශයෙන් සියයට 14.9 ක් වූ වර්තන වියදම 2013 වර්ෂයේ දී සියයට 13.9 ක් දක්වා අඩු වූයේ එහි වර්ධනය දළ දේශීය නිෂ්පාදිතයෙහි නාමික වර්ධනයට වඩා අඩු වර්ධනයක් පෙන්වූ බැවිනි.

සම්පත් පාදක කරගත් ආර්ථික වර්ධනයක් වෙත සංක්‍රමණය වෙමින් පවතින රටෙහි ආර්ථිකයට පහසුකම් සැපයීම උදෙසා රජය විසින් ආර්ථික සහ සමාජීය යටිතල පහසුකම් සැපයීම නඟාසිටුවීම පිණිස ක්‍රියාශීලී ලෙස මැදිහත් වී සිටියි. ඒ අනුව රජය විසින් රාජ්‍ය ආයෝජන ලෙස 2012 වර්ෂයේ දී දරනු ලැබූ රු.බිලියන 444 ට සාපේක්ෂව 2013 වර්ෂයේ දී රු.බිලියන 481 ක් වැය කර ඇත. රජය විසින් වාර්ෂික රාජ්‍ය ආයෝජන ප්‍රමාණය ද.දේ.නි. ප්‍රතිශතයක් ලෙස සියයට 6.0 ක පමණ මට්ටමක පවත්වාගෙන යාමට කැපවී ඇති අතර 2012 වර්ෂයේ දී ද.දේ.නි. යට සාපේක්ෂව සියයට 5.9 ක් වූ රාජ්‍ය ආයෝජනය 2013 වර්ෂයේ දී සියයට 5.5 ක් විය.

වර්ෂ 2005 සිට 2013 දක්වා කාලපරිච්ඡේදය තුළ ද.දේ.නි. යේ ප්‍රතිශතයක් ලෙස රාජ්‍ය ආයෝජනවල සාමාන්‍ය අගය සියයට 6.2 කි. විදුලිබල උත්පාදන ධාරිතාවය, වරාය සහ ගුවන් තොටුපල, මහා මාර්ග, අධිවේගී මාර්ග, දුම්රිය මාර්ග, ජාතික ජලාපවහන පද්ධතිය, පානීය ජල සැපයුම් සහ සනීපාරක්ෂක සේවා, පාසල්, වෘත්තීය පුහුණු ආයතන, විශ්ව විද්‍යාල, රෝහල් සහ අනෙකුත් සේවා පහසුකම් සැපයීම යනාදියෙහි ස්ථාවර වර්ධනයක් අත්කර ගෙන ඇති අතර 2013 වර්ෂයේ දී එම කටයුතු අඛණ්ඩව පුළුල් කරන ලදී.

ඉහළ ආර්ථික වර්ධනයක් කරා ළඟාවීම සඳහා හිතකර අනාගත වාතාවරණයක් පවත්වා ගැනීමට උපකාරී වෙමින් රටෙහි ධාරිතාවය ඉහළ නැංවීමට, රාජ්‍ය ආයෝජන මත කරනු ලබන තිරසාර වියදම ඉඩසලසා ඇත. අඛණ්ඩව සිදුකරන ලද රාජ්‍ය ආයෝජනයෙහි ප්‍රතිඵලයක් ලෙස 2012 දී මෙ.වො. 2,231 ක් වූ බලශක්ති උත්පාදන ධාරිතාව 2013 වර්ෂයේ දී මෙ.වො. 3,371 ක් දක්වා ද, 2002 දී අඩි 20 ට සමාන බහලු ඒකක (TEU) මිලියන 4.3 ක් වූ රටේ වරාය ධාරිතාව 2013 වර්ෂයේ දී අඩි 20 ට සමාන බහලු ඒකක (TEU) මිලියන 6.9 දක්වා ද පුළුල් විය. දේශීය ගුවන් තොටුපල ධාරිතාව ද පුළුල් වූ අතර 2002 දී මිලියන 3 ක් වූ ජාත්‍යන්තර ගුවන් තොටුපලවල මගී ධාරිතාවය 2013 වර්ෂයේ දී මිලියන 7 දක්වා ද 2002 දී වර්ග කිලෝ මීටරයකට කිලෝ මීටර් 1.68 ක් වූ මාර්ග ඝනත්වය 2013 වර්ෂයේ දී කිලෝ මීටර් 1.76 දක්වා සහ 2005 දී ඝන මීටර් මිලියන 350 ක් වූ ජලසැපයුම් ධාරිතාව 2013 වර්ෂයේ දී ඝන මීටර් මිලියන 547 ක් දක්වා ද වර්ධනය විය. තවද, විදුලිය සැපයුම් සියයට 96 දක්වා සහ පිරිසිදු පානීය ජල සැපයුම සියයට 88.7 දක්වා ඉහළ නැංවීමටත් ප්‍රවාහන, අධ්‍යාපන සහ සෞඛ්‍ය පහසුකම් විශාල වශයෙන් වැඩි දියුණු කිරීමටත් මෙම රාජ්‍ය ආයෝජන උපකාරී වී ඇත. 2002 දී සියයට 97.2 ක් වූ පාසැල් වල ප්‍රාථමික අංශයට ඇතුළත් වීමේ ප්‍රතිශතය 2012 දී සියයට 98.4 දක්වා වර්ධනය වී ඇත. 2004 වසර හා සැසඳීමේ දී රෝහල් ඇඳන් සංඛ්‍යාව (පුද්ගලයන් 1,000 කට) 3.1 සිට 3.6 දක්වා ද, වෛද්‍යවරයෙක් සඳහා පුද්ගලයින් සංඛ්‍යාව 2,224 සිට 1,167 දක්වා ද, හෙද සේවක සංඛ්‍යාව (පුද්ගලයින් 10,000 කට) 8.9 සිට 15.1 දක්වා ද වර්ධනය වෙමින් පොදු සෞඛ්‍ය පහසුකම් වඩාත් යහපත් තත්ත්වයකට පත් වී ඇත. මෙම යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති මගින් 2002 වර්ෂයේ සියයට 22.7 ක් වූ දිළිඳුකම සියයට 6.7 දක්වා අඩු වී ඇත.

2012 දී රු. බිලියන 79.6 ක් වූ ආදායම් හිඟය එනම් මුළු ආදායම හා වර්තන වියදම අතර පරතරය 2013 වර්ෂයේ දී රු. බිලියන 67.7 ක් විය. ද.දේ.නි. ප්‍රතිශතයක් ලෙස ආදායම් ගිණුමෙහි හිඟය පෙර වර්ෂයේ වාර්තා වූ සියයට 1 සිට සියයට 0.8 දක්වා අඩු විය. ආදායමේ අඩුවීම අනුව වර්තන වියදම සීමා කිරීම මීට හේතු විය. ආදායම් ගිණුමේ හිඟය, විදේශීය ප්‍රදාන රු. බිලියන 15.9 ක් හා ප්‍රාග්ධන වියදම් සහ ශුද්ධ ණය දීම් රු. බිලියන 464.2 ක ප්‍රතිඵලයක් වශයෙන් සමස්ත අයවැය හිඟය 2012 වසරේදී පැවති රු. බිලියන 489 ට සාපේක්ෂව 2013 වසරේ දී රු. බිලියන 516 ක් විය. එසේ වුවද, 2012 වර්ෂයේ දී ද.දේ.නිෂ්පාදිතයෙන් සියයට 6.5 ක් වූ අයවැය හිඟය 2013 වර්ෂයේ දී සියයට 5.9 ක් දක්වා අඩු වූයේ 2009 වර්ෂයේ දී වාර්තා වූ සියයට 9.9 ක ඉහළ අගයක සිට ක්‍රමානුකූල අඩුවීම සිදුවන අනුගාමී වසරටත් පෙන්නුම් කරමිනි.

අයවැය හිඟය මූල්‍යනය සඳහා රු. බිලියන 448 ක් (මුළු මූල්‍යනයෙන් සියයට 86.8 ක් එනම් ද.දේ.නි. යෙන් සියයට 5.2 ක්) දේශීය මූලාශ්‍ර වලින් ශුද්ධ ණය ලෙස ලබාගන්නා ලදී. 2012 දී වාර්තා වූ රු. බිලියන 106 ට සාපේක්ෂව 2013 වර්ෂයේ දී රු. බිලියන 55.8 ක් වූ අනේවාසික තැනැත්තන් විසින් රජයේ සුරැකුම්පත්වල කරන ලද ආයෝජන ශුද්ධ දේශීය ණය ගැනීම්වල ඇතුළත් වේ. අයවැය හිඟයේ ශුද්ධ මූල්‍යනයේ ශේෂයෙන් රු. බිලියන 68 ක්

(මුළු මූල්‍යනයෙන් සියයට 13.2 ක් හෙවත් ද.දේ.නි. යෙන් සියයට 0.8 ක්) විදේශීය මූලාශ්‍ර වලින් ලබා ගන්නා ලදී.

සමස්ත දේශීය මූල්‍යනය සඳහා 2012 වර්ෂයේ දී රු. බිලියන 131.5 ක් වූ බැංකු ණය ලබාගැනීම් 2013 වර්ෂයේ දී රු. බිලියන 297 දක්වා වැඩි විය. පෙර වර්ෂයේ වාර්තා වූ සියයට 42.7 ට සාපේක්ෂව 2013 වර්ෂයේ බැංකු මගින් ණය ලබාගැනීම සමස්ත දේශීය ණය ගැනීම් වලින් සියයට 66.3 ක් විය. මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය අඩුවීම සහ මහ බැංකුවෙන් ලබාගත් තාවකාලික අත්තිකාරම් අඩු වීමත් සමඟ ඉන් ලබාගත් ශුද්ධ ණය ප්‍රමාණය රු. බිලියන 164.8 කින් කැපී පෙනෙන ලෙස අඩුවීම සහ වාණිජ බැංකු මගින් රු. බිලියන 461.8 ක නව ණය ගැනීම් සිදු කිරීම මෙම වැඩිවීමට හේතු විය. වාණිජ බැංකු විසින් භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර මත කෙරුනු ආයෝජන ඉහළ යාම ප්‍රධාන වශයෙන් වාණිජ බැංකු වලින් ලබාගත් ණය ප්‍රමාණය වැඩි වීමට හේතු විය. 2012 වර්ෂයේ දී ද.දේ.නි. යේ ප්‍රතිශතයක් ලෙස සියයට 1.7 ක් වූ බැංකු මඟින් ලබාගත් ණය ප්‍රමාණය 2013 වර්ෂයේ දී සියයට 3.4 දක්වා වැඩිවිය.

2012 වර්ෂයේ ලබාගත් රු. බිලියන 71 ට සාපේක්ෂව බැංකු නොවන මූලාශ්‍ර මඟින් ශුද්ධ ණය ගැනීම් 2013 වර්ෂයේ දී රු. බිලියන 95.4 දක්වා වැඩි විය. 2013 වර්ෂයේ දී එම ප්‍රමාණය සමස්ත දේශීය මූල්‍යනයෙන් සියයට 21.3 ට සාපේක්ෂව පසුගිය වසරේ සියයට 23 ක් වූ අතර, සේවක අර්ථසාධක අරමුදල, ජාතික ඉතිරි කිරීමේ බැංකුව සහ සේවක භාරකාර අරමුදල පෙර වර්ෂවල මෙන්ම මෙම වර්ෂයේ ද බැංකු නොවන මූලාශ්‍ර මඟින් මූල්‍යනය සඳහා ප්‍රධාන දායකත්වය දැරීය. බැංකු නොවන මූලාශ්‍ර මගින් ශුද්ධ ණය ගැනීම් ද.දේ.නි. යේ ප්‍රතිශතයක් ලෙස 2012 දී වාර්තා වූ සියයට 0.9 සිට 2013 වර්ෂයේ දී සියයට 1.0 දක්වා වැඩි විය. දේශීය මුදල් වෙළඳපොලේ පැවති ඉහළ ද්‍රවශීලතාවයේ ප්‍රතිඵලයක් ලෙස, දේශීය මූලාශ්‍ර මගින් ණය ගැනීම් වැඩි වී තිබියදීත් රජයේ සුරැකුම්පත්වල පොලී අනුපාත ස්ථාවරව පැවතුණි. දේශීය වශයෙන් ණය ලබාගැනීමේ දී රජය වැඩි වශයෙන් භාණ්ඩාගාර බැඳුම්කර වැනි උපකරණ හා දිගුකාලීන අලෙවි කළ හැකි සුරැකුම්පත් මත පදනම් වූ අතර 2013 වර්ෂයේ දී වසර 30 ක පරිනත කාලයකින් යුත් අවුරුදු භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම ද ආරම්භ කරන ලදී.

රාජ්‍ය ආයෝජන කටයුතු වෙනුවෙන් ලබාගත් ව්‍යාපෘති ණය වලට අදාළ මුළු විදේශීය ණය ප්‍රමාණය 2013 වර්ෂයේ දී රු. බිලියන 179.3 ක් විය. විදේශ ණය ආපසු ගෙවීම් රු. බිලියන 111.4 ක් වූ බැවින් 2013 වර්ෂයේ දී ශුද්ධ විදේශ මූල්‍යනය රු. බිලියන 67.9 ක් වූ අතර එය ද.දේ.නි. යෙන් සියයට 0.8 ක් විය.

2013 වර්ෂය අවසන් වනවිට රාජ්‍ය ණය රු. බිලියන 6,793.2 ක් විය. මෙය රු. බිලියන 3,832.8 ක දේශීය ණය සහ රු. බිලියන 2,960.4 ක විදේශීය ණය වලින් සමන්විත විය. 2012 වර්ෂයේ දී වාර්තා වූ සියයට 79.2 සාපේක්ෂව සමස්ත ණය ප්‍රමාණය ද.දේ.නි. යේ

ප්‍රතිශතයක් ලෙස 2013 වර්ෂයේ දී සියයට 78.3 ක් විය. 2009 වර්ෂයේ දී ද.දේ.නි. යෙන් සියයට 9.9 ක් වූ අයවැය හිඟය 2013 දී සියයට 5.9 කට සීමා කිරීම සහ ද.දේ.නි. යේ වර්ධන වේගයේ සාමාන්‍යය සියයට 6.7 ක ඉහළ අගයක පවත්වාගෙන යාමේ ප්‍රතිඵලය ද.දේ.නි. යෙන් සියයට 105.6 ක් ලෙස 2002 වර්ෂයේ දී පැවති ණය ප්‍රමාණය 2013 වර්ෂයේ දී සියයට 78.3 දක්වා ඒකක 27.6 කින් වසර 11 කදී අඩුවීම තුළින් පිළිබිඹු වේ. මේ අතර, විදේශ විනිමය විචලනය වීම නිසා විදේශ ණය ප්‍රමාණය 2013 දී රු. බිලියන 25.5 කින් අඩු වූ අතර ප්‍රධාන වශයෙන් දිගුකාලීන රජයේ සුරැකුම්පත් නිකුත් කිරීම වැඩිවීම නිසා වට්ටම් සාධනය (භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර නිකුතුවේ දී හා කල් පිරීමේ දී මුහුණත වටිනාකම හා පොත් අගය අතර ශුද්ධ වෙනස) ඉහළ යාම මඟින් දේශීය ණය මත බලපෑමක් ඇතිවිය.

2013 වසර අවසානයේදී සමස්ත ණයවලින් සියයට 56.4 ක් දේශීය ණය විය. දේශීය මූල්‍යනය මත වැඩි වශයෙන් රඳා පැවැත්ම පිළිබිඹු කරමින් 2012 වර්ෂයේ දී ද.දේ.නි. යෙන් සියයට 42.7 ක් වූ දේශීය ණය ප්‍රමාණය 2013 වර්ෂයේ දී සියයට 44. 2 දක්වා වැඩි විය. සමස්ත ණය ප්‍රමාණයෙන් රු. බිලියන 2,923 ක් දිගු හා මධ්‍ය කාලීන කල් පිරීමේ කාලයක් සහිතවූ අතර 2012 දී සියයට 74.8 ක් වූ එය 2013 වර්ෂයේ දී සියයට 76.3 ක් විය. ඉතිරි රු. බිලියන 909 ක් හෙවත් සියයට 23.7 ක ප්‍රමාණය කෙටිකාලීන කල්පිරීමේ කාලයකින් යුක්තවූ අතර එය 2012 දී වාර්තා වූ සියයට 25.2 ට වඩා අඩු අගයකි.


## 1.1. රජයේ ආදායම

2013 වර්ෂයේ ජුනි මාසය වනතෙක් අඩුවීමේ ප්‍රවණතාවයක් පැවතියද 2013 වර්ෂය තුළ රාජ්‍ය ආදායම් ක්‍රියාකාරිත්වයේ වර්ධනය වීමක් පෙන්නුම් කරයි. වෙළඳ ගිණුමේ හිඟය කළමනාකරණය සඳහා තෝරා ගත් ආනයන සීමා කිරීම සහ දේශීය ඉල්ලුම සීමා කිරීම සඳහා ණය වර්ධනයෙහි සීමා පැනවීම, විනිමය අනුපාතය වඩාත් නම්‍යශීලී කිරීම සමගම සාර්ව ආර්ථික ස්ථායිතාවය පවත්වා ගැනීම සඳහා රජය විසින් 2012 වර්ෂයේ මුල් භාගයේ හඳුන්වා දුන් ප්‍රතිපත්තිමය රාමුවෙහි ප්‍රතිඵලයක් ලෙස වර්ෂයේ මුල් භාගයෙහි ආදායම් රැස් කිරීම දුර්වල මට්ටමක පැවතියද, ලෝක ආර්ථිකයේ ක්‍රමික පිබිදීමෙහි ප්‍රතිඵලයක් ලෙස වර්ෂයේ දෙවන භාගයේදී රටේ ආර්ථික කටයුතු වේගවත් වීම ආදායම කෙරෙහි හිතකර ලෙස බලපෑවේය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බදු (PAL) සහ ආර්ථික සේවා ගාස්තු (ESC) හැර ඉතිරි ප්‍රධාන බදුවලින් ලද ආදායමේ වර්ධනයක් දක්නට ලැබුණි.

2012 වර්ෂයේ දී වාර්තා වූ රු. බිලියන 1,051.5 ට සාපේක්ෂව සමස්ත ආදායම 2013 වර්ෂයේ දී රු. බිලියන 1,137.4 දක්වා සියයට 8.2 කින් වර්ධනය වී ඇත. වර්ෂයේ මුල් භාගය තුළ දී මුළු ආදායමෙහි වර්ධනය අඩුවීමේ ප්‍රවණතාවයක් පෙන්වූ අතර වර්ෂයේ දෙවන භාගය තුළ දී එය වර්ධනය වී ඇත. සමස්ත ආදායම් කාර්ය සාධනය අනුව බදු

ආදායම 2012 වර්ෂයට සාපේක්ෂව රු. බිලියන 1,005.9 දක්වා සියයට 10.7 කින් වර්ධනය වූ අතර බදු නොවන ආදායම රු. බිලියන 131.6 දක්වා සියයට 7.7 කින් අඩුවිය. ආනයන ඉල්ලුම අඩු වීමත් 2013 වර්ෂයේ මුල් භාගය තුළ දේශීය ආර්ථික කටයුතු මන්දගාමී වීමත් හේතුවෙන් 2013 වර්ෂය තුළ දී ද.දේ.නි. ප්‍රතිශතයක් වශයෙන් සමස්ත ආදායම අයවැයෙන් අපේක්ෂිත සියයට 14.7 ට සාපේක්ෂව සියයට 13.1 දක්වා අඩු වීමක් පෙන්නුම් කළේය.

2013 වර්ෂයේ ආදායම් බදු ආදායම සියයට 19.2 ක තියුණු වර්ධනයක් පෙන්නුම් කරයි. බදු අනුපාතය අඩු කිරීමේ සහ බදු පදනම පුළුල් කිරීමේ අරමුණින් 2011 වර්ෂයේ දී හඳුන්වා දෙනු ලැබූ බදු ප්‍රතිසංස්කරණ ක්‍රමානුකූලව ආර්ථිකයේ ස්ථාපිත වන අයුරු මින් පිළිබිඹු විය. 2011 වර්ෂයේ දී හඳුන්වා දෙනු ලැබූ අඩු බදු අනුපාත හා පුළුල් බදු පදනමකින් යුතු බදු ක්‍රමය යටතේ වුවද ඉහළ වැටුප් ආදායම්, එම බදු සඳහා යටත් වන්නා වූ රැකියා වර්ධනයවීම සහ එවැනි බදු මූලාශ්‍රයන්හිදීම අවසාන බද්දක් ලෙස අයකර ගැනීම හේතුවෙන් උපයන විට ගෙවන බදු ආදායම සියයට 25.7 කින් වර්ධනය වී ඇත. අවසාන බද්දක් වශයෙන් මූලාශ්‍රයේදීම අයකර ගනු ලබන පොලී මත බදු ආදායම ද 2013 වර්ෂයේ දී සියයට 30.7 ක ඉහළ වර්ධනයක් පෙන්නුම් කරයි. ඉහළ පිරිවැටුම් පැවතීම, දිගු කාලීන පරිණත කාලයක් සහිතව රාජ්‍ය සුරැකුම්පත් නිකුත් කිරීම සහ බැංකු හා මූල්‍ය පද්ධතිවල ඉතුරුම් පදනම පුළුල් වීම මෙම වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී ඇත. වර්ෂය තුළ ණය වර්ධනය අඩු වුව ද බැංකු හා මූල්‍ය ආයතන, රක්ෂණ, ආනයන හා අපනයන වෙළඳාම, දුම්කොළ හා ආහාරපාන, නිෂ්පාදන, සංචාරක හා සේවා අංශවල ඉහළ කාර්ය සාධනය හේතුවෙන් සංස්ථාපිත සහ සංස්ථාපිත නොවන ආදායම මත බදු සියයට 23.1 ක කැපී පෙනෙන කාර්ය සාධනයක් පෙන්නුම් කරයි. මෙහි විශේෂ ලක්ෂණය වන්නේ පරිභෝජනය මත පදනම් වූ වක්‍ර බදු වලට වඩා ආදායම් මත පදනම් වූ බදු ඉහළ වර්ධනයක් පෙන්වීම වන අතර සමස්ත බදු ආදායමෙන් ආදායම් බදු කොටස පුළුල් කිරීම ඉතා වැදගත් වේ. මේ අතර කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා සහන සැලසීමේ අරමුණින් ආර්ථික සේවා ගාස්තුවට යටත් පිරිවැටුමේ සීමාව කාර්තුවකට රු. බිලියන 50 දක්වා ඉහළ දැමීමත්, පිරිවැටුම මත ආර්ථික සේවා ගාස්තු ගෙවන ලාභයන් සහිත ඕනෑම ව්‍යාපාරයක් ආදායම් බදු වලට යටත්ව ආර්ථික සේවා ගාස්තු ගෙවීමෙන් නිදහස් කිරීම සහ බදු විරාම කාලසීමාවන් දීර්ඝ කිරීම හේතුවෙන් ආර්ථික සේවා ගාස්තු මගින් ලද ආදායම සියයට 55.6 කින් ඉහළ ගියේය. වර්ෂයේ දෙවන භාගයේ ආර්ථිකයේ ඇති වූ වර්ධනයට සමගාමීව දේශීය ආර්ථික ක්‍රියාකාරකම් මත අයකරනු ලැබූ වක්‍ර බදු ආදායමෙහි වර්ධනයක් පෙන්නුම් කරන ලදී. 2011 වර්ෂයට පෙර ක්‍රියාත්මක වූ සියයට 12 සහ සියයට 20 යන ද්විත්ව අනුපාත වෙනුවට එකතු කළ අගය මත බදු සඳහා හඳුන්වා දුන් තනි අනුපාත ක්‍රමයෙහි සාර්ථකත්වය පිළිබිඹු කරමින්, 2013 වර්ෂයෙහි දේශීය ක්‍රියාකාරකම් මත අයකර ගන්නා ලද එකතු කළ අගය මත බදු ආදායම සියයට 13.6 කින් වර්ධනය විය. එමෙන්ම, දේශීය ක්‍රියාකාරකම් මත අයකර ගන්නා ලද ජාතිය ගොඩනැගීමේ බදු ආදායම ද සියයට 9.4 කින් වර්ධනය විය. සිගරට් සහ මත්පැන් මත අයකරනු ලබන බදු ඉහළ දැමුවද, නිෂ්පාදන ප්‍රමාණය හෝ විකුණුම් ප්‍රමාණය පහළ යාම රජයේ බදු ආදායම පහත වැටීමට ප්‍රධාන වශයෙන්ම බලපාන ලදී.




## 1.2. රාජ්‍ය ආදායමේ විචලතා විශ්ලේෂණය - 2013 (රු. බිලියන)

| අයිතමය | 2012 (සත්‍ය) | 2013 (තාවකාලික) | බලපාන ලද කරුණු |
|---|---|---|---|
| ආදායම් බදු | 172,593 | 205,666 | රාජ්‍ය අංශයට සේවා නියුක්තිකයින් ඇතුළත්වීම තුලින් බදු පදනම පුළුල් වීම, බදු අනුකූලතාවය ඉහළයාම සහ තොරතුරු තාක්ෂණ හා වෘත්තීය සේවා, අපනයන, සංචාරක සහ වාණිජ බැංකු වැනි අංශවල ඉහළ වැටුප් ලබන ස්ථර පුළුල් වීම නිසා උපයන විට ගෙවීමේ බදු ආදායමේ කැපී පෙනෙන වර්ධනයක් ඇති විය. ඉහළ ආර්ථික ප්‍රතිලාභ සහිත පෞද්ගලික අංශයේ ක්‍රියාකාරකම්වල වර්ධනය තුලින් සංස්ථාපිත බදු ආදායම ද කැපී පෙනෙන ලෙස ඉහළ ගියේය. භාණ්ඩාගාර බැඳුම්කර හා භාණ්ඩාගාර බිල්පත් විශාල ප්‍රමාණයක් නිකුත් කිරීම පොලිය මත බදු ආදායම වර්ධනය වීමට හේතු විය. කෙසේ වෙතත් ආර්ථික සේවා ගාස්තුව වෙතින් ලද ආදායම අඩු වීම මුළු ආදායම් බදු ආදායම අඩුවීමට හේතු විය. |
| එකතු කළ අගය මත බදු | 229,604 | 250,523 | තොග හා සිල්ලර වෙළඳාම මත එ.අ.බ. පැනවීම, නිෂ්පාදන අංශයේ හෝටල්, ආපනශාලා සහ ආහාරපාන සැපයීමේ සේවා වැනි අංශවල වර්ධනය සහ සරල කරන ලද එ.අ.බ. ක්‍රමය හඳුන්වා දීමෙන් බදු ආපසු ගෙවීම අවම වීම දේශීය ක්‍රියාකාරකම් මත එ.අ.බ. ආදායම ඉහළ යාමට හේතු විය. කෙසේ වෙතත්, වෙළඳ හිඟය පුළුල්වීම පාලනය කිරීම සඳහා ගනු ලැබූ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග එනම් ඉහළ නිෂ්පාදන |


| | | | |
|---|---|---|---|
| | | | බදු, ණය වර්ධනයට අදාළ සීමා පැනවීම සහ විනිමය අනුපාත අවප්‍රමාණය කිරීම වැනි ක්‍රියාමාර්ග නිසා ආනයන අඩු වීම හේතුවෙන් ආනයන මත එ.අ.බ. ආදායම් ඇස්තමේන්තුගත ප්‍රමාණයට වඩා අඩු විය. |
| නිෂ්පාදන බදු / සුරා බදු | 223,960 | 250,700 | ප්‍රධාන ප්‍රභවයන් වන මත්පැන්, සිගරට් සහ දුම්කොළ නිෂ්පාදන සහ මෝටර් රථ වාහන මත නිෂ්පාදන බදු ඉහළ දැමීම සහ ඉහළ වටිනාකමක් සහිත වාහන ආනයනය කිරීම වැඩි වීම තුළින් මෙම ආදායම ඉහළ ගියේය. ඛණිජ තෙල් නිෂ්පාදන සහ අනිකුත් ප්‍රභවයන් මගින් 2013 වර්ෂයේ ඉපයූ නිෂ්පාදන බදු ආදායම අපේක්ෂිත වර්ධනයට වඩා අඩු විය. . |
| ආනයන බදු | 80,155 | 83,123 | මෙම ආදායම කෙරෙහි බද්දට යටත් ආනයන ප්‍රමාණය අඩුවීම සෘණාත්මකව බලපාන ලදී. කෙසේ වෙතත් දේශීය කිරි නිෂ්පාදන දිරි ගැන්වීම සඳහා කිරිපිටි ආනයන මත බදු නිදහස් කිරීම අඩු කිරීම සහ මද්‍යසාර, ස්ප්‍රීතු, සිගරට් සහ දුම්කොළ නිෂ්පාදන මත ආනයන බදු ඉහළ දැමීම ආනයන බදු ආදායම පසුගිය වසරට වඩා ඉහළයාමට හේතු විය. |
| වරාය හා ගුවන් තොටුපොළ සංවර්ධන බදු | 70,111 | 61,987 | සමස්ත ආනයනවල පහත වැටීම විශේෂයෙන් පරිභෝජන භාණ්ඩ හා අතරමැදි භාණ්ඩ ආනයන පහත වැටීම මෙම බදු ආදායම අඩුවීමට හේතු විය. |
| ජාතිය ගොඩනැගීමේ බද්ද | 38,736 | 40,937 | සමස්ත ආනයන ප්‍රමාණය සැලකිය යුතු මට්ටමකින් අඩුවීම හා ඇතැම් ආනයන සඳහා ලබාදුන් නිදහස් කිරීම් ජා.ගො.නැ. බදු ආදායම ඇස්තමේන්තුගත ආදායමට වඩා අඩුවීමට හේතු විය. කෙසේ වෙතත්, දේශීය වශයෙන් බද්දට යටත් පිරිවැටුමේ සීමාව ඉහළ දැමුවද දේශීය නිෂ්පාදන කර්මාන්ත අංශයේ වර්ධනය සහ බැංකු, හෝටල්, ආපනශාලා, සංචාරක ඇතුලු සේවා අංශයේ වර්ධනය හේතුවෙන් 2012 වර්ෂයට සාපේක්ෂව දේශීය අංශයෙන් මෙම බදු ආදායමට කරන ලද දායකත්වය ඉහළ ගියේය. |
| අනිකුත් බදු | 93,749 | 112,958 | විශේෂ වෙළඳ භාණ්ඩ බද්දට අයත් භාණ්ඩ ලේඛනයට නව භාණ්ඩ කිහිපයක් ඇතුළත් කිරීම සහ දේශීය නිෂ්පාදන ක්‍රියාවලිය දිරිගැන්වීම සඳහා තෝරාගත් භාණ්ඩ සඳහා බදු අනුපාත සංශෝධනය කිරීම හේතුවෙන් පසුගිය වර්ෂය හා සැසඳීමේ දී මෙම බදු ආදායම ඉහළ ගිය අතර විදුලි සංදේශ බදු ආදායම ඉහළ යාමද මේ සඳහා දායක විය. කෙසේ වෙතත්, සමස්ත ආනයනවල පහත වැටීම හේතුවෙන් විශේෂ වෙළඳ භාණ්ඩ බදු සහ සෙස් බදු තුළින් අපේක්ෂිත ආදායම නොලැබීමෙන් |

| | | | |
|---|---|---|---|
| | | | ඇස්තමේන්තුගත ආදායමට ලඟාවීමට නොහැකි විය. |
| බදු නොවන ආදායම | 142,547 | 131,553 | විකුණුම් සහ ගාස්තු මගින් ලද ආදායම ඉහළ ගියද ශ්‍රී ලංකා මහ බැංකුව මඟින් ලැබූ ලාභ පැවරුම් අඩුවීම පසුගිය වර්ෂයේ ලද බදු නොවන ආදායමට වඩා අඩුවීමට ප්‍රධාන වශයෙන් හේතු විය. |

## 2. 2013 වසරේ කාර්ය සාධනය

### 2.1. ආදායම් රැස් කිරීමේ කාර්යයෙහි නිරත සියලු දෙපාර්තමේන්තු සමග මනා සම්බන්ධීකරණයක් පවත්වා ගනිමින් රජයේ ආදායම් වර්ධනය කර ගැනීමට ක්‍රියා කිරීම

2013 වර්ෂයේ මුළු රාජ්‍ය ආදායම රු. බිලියන 1,137.4කි. එය 2012 වර්ෂයේ රු. බිලියන 1,051.5 හා සැසඳීමේ දී සියයට 8.2 ක වැඩිවීමකි. මුළු රාජ්‍ය ආදායමෙන් බදු ආදායම රු. බිලියන 1,005.9 ක් වූ අතර බදු නොවන ආදායම රු. බිලියන 131.6ක් විය.




### 2.2. රාජ්‍ය ආදායම් සාරාංශය

රු. මිලියන

| | 2012 | 2013 |
|---|---|---|
| **බදු ආදායම** | **908,913** | **1,005,895** |
| ආදායම් බදු | 172,593 | 205,666 |
| එකතු කළ අගය මත බදු | 229,604 | 250,523 |
| ජාතිය ගොඩනැගීමේ බදු | 38,736 | 40,937 |

| | | |
|---|---|---|
| නිෂ්පාදන බදු | 223,960 | 250,700 |
| ආනයන බදු | 80,155 | 83,123 |
| වරාය හා ගුවන් තොටුපොල සංවර්ධන බදු | 70,111 | 61,987 |
| විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු | 33,666 | 46,705 |
| අනෙකුත් | 60,088 | 66,255 |
| **බදු නොවන ආදායම** | **142,547** | **131,552** |
| පොලී / කුලී | 11,686 | 11,995 |
| ලාභ සහ ලාභාංශ | 46,761 | 35,169 |
| විකුණුම් සහ ගාස්තු | 26,019 | 40,720 |
| සමාජ ආරක්ෂණ දායකත්වය | 11,738 | 15,145 |
| මහ බැංකු ලාභ පැවරුම් | 43,000 | 26,350 |
| අනෙකුත් | 3,343 | 2,173 |
| **මුළු ආදායම** | **1,051,460** | **1,137,447** |

## 2.3. රජය විසින් වරින්වර ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණවලට අනුකූලව බදු සම්බන්ධ නීතීන්ට සිදු කරන ලද සංශෝධන

### 2.3.1. මෙම දෙපාර්තමේන්තුව විසින් 2013 වසර තුළදී නිකුත් කරන ලද ගැසට් නිවේදන

**(i) නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත**

- 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත (2013.01.15 දිනැති 1793/5 දරන ගැසට් නිවේදනය) - ගුවන් තොටුපල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම විසින් නිකුත් කරනු ලැබූ ගුවන් මගීන්, ගුවන් තොටුපල වෙත සහ ගුවන් තොටුපලින් ප්‍රවාහනය කිරීම සඳහා වලංගු අවසර පත්‍රයක් දරන්නෙකු විසින් භාවිතා කරන රථයක් වෙනුවට එම කාර්යය සඳහා යොදා ගැනීමට ආනයනය කරනු ලබන මෝටර් රථයක් සඳහා ආනයනයේදී ගෙවිය යුතු බදු අඩු කිරීම සඳහා 2012 අයවැය මඟින් ලබාදුන් කොන්දේසි සංශෝධනය කිරීම.

- 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත (2013.07.29 දිනැති අංක 1821/1 දරන ගැසට් නිවේදනය) - මූලික වශයෙන් භාණ්ඩ ප්‍රවාහනය කිරීම සඳහා වූ මෝටර් වාහනවලට අදාළ බදු අනුපාතයන්ගේ විෂමතාවයන් අවම කිරීම සහ එකී මෝටර් වාහන මගින් ජාතික මාර්ග ජාලය නඩත්තුවට වැඩි දායකත්වයක් ලැබීම සහතික කිරීම සඳහා මගීන්ට හා භාණ්ඩ සඳහා වෙන වෙනම කුටීර සහිත (කෘෘ කැබ්) වාහන සඳහා පැවති සියයට 12 ක නිෂ්පාදන බද්ද සියයට 27 දක්වාද දළ වාහන බර ටොන් 5 ඉක්ම වූ එහෙත් ටොන් 20 නොඉක්ම වූ වාහන සඳහා පැවති සියයට 15 බද්ද සියයට 29 දක්වාද දළ වාහන බර ටොන් 20 ඉක්ම වූ වාහන සඳහා පැවති සියයට 20 බද්ද සියයට 35 දක්වාද ඉහළ දැමීම.

- 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත (2013.11.21 දිනැති අංක 1837/29 දරන ගැසට් නිවේදනය) - හඳුනාගත් සංයෝජිත වර්ගීකරණ සංකේත අංකවල විස්තර සංශෝධනය කිරීම හා ජාතික උප බෙදුම් අංක හඳුන්වා දීම, 2710.12.20, 2710.19.40, 8704.21.51, 8704.21.52, 8704.31.41 සහ 8704.31.42 යන සංයෝජිත වර්ගීකරණ සංකේත අංක

යටතේ වන නිෂ්පාදන බදු අනුපාත සංශෝධනය කිරීම හා රේගු බදු අනුපාතයන් පහත හෙළීම හේතුවෙන් ආදායමට බලපෑමක් ඇති නොවීම සඳහා 87 වන පරිච්ඡේදයෙහි සඳහන් නිෂ්පාදන බදු අනුපාතයන් ගැලපීමට අදාළ 2014 අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම.

**(ii) සෙස් බදු**

- 1979 අංක 40 දරන අපනයන සංවර්ධන පනත (2013.01.22 දිනැති අංක 1794/9 දරන ගැසට් නිවේදනය) - ආනයනික සකස් නොකළ අමුද්‍රව්‍ය භාවිතා කරනු ලබන ඇඟළුම් කර්මාන්තයන්හි දේශීය සැකසුම් දිරිගැන්වීම සඳහා වීරංජනය නොකළ කපු රෙදි වර්ග සඳහා ආනයනික සෙස් බද්ද කිලෝ ග්‍රෑමයට රු.75 දක්වා සහ අනෙකුත් රෙදි වර්ග සඳහා ආනයන සෙස් බද්ද කිලෝ ග්‍රෑමයට රු.100 දක්වා අඩු කිරීම.

- 1979 අංක 40 දරන අපනයන සංවර්ධන පනත (2013.01.22 දිනැති අංක 1794/10 දරන ගැසට් නිවේදනය) - තොග වශයෙන් වූ තේ සඳහා වූ සෙස් බද්ද කි.ග්‍රෑමයකට රු. 10/ හෝ කොළඹ තේ වෙන්දේසියෙහි සාමාන්‍ය තේ මිලෙන් 2.5% යන අගයන්ගෙන් ඉහළ අගය ලෙස සංශෝධනය කිරීම, සෑම මසකම කාලපරිච්ඡේදයක් සඳහා අදාළ වන්නා වූ කොළඹ තේ වෙන්දේසියෙහි සාමාන්‍ය මිල, ශ්‍රී ලංකා තේ මණ්ඩලයෙහි අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ උපදෙස් පරිදි රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තීරණය කරනු ලබන අතර එම මිල අදාළ මාසයෙහි පළමු දින සිට ක්‍රියාත්මක වේ. කොළඹ තේ වෙන්දේසියෙහි සාමාන්‍ය තේ මිල ගණනය කිරීම, සෑම මසකම එම මිල ගණන ක්‍රියාත්මක වන දිනට මසකට පෙරාතුවම වූ අනුගාමී මාස දෙක තුළ කොළඹ තේ වෙන්දේසියෙහි පැවති සාමාන්‍ය තේ මිල සැලකිල්ලට ගෙන සිදුකෙරෙනු ඇත.

- 1979 අංක 40 දරන අපනයන සංවර්ධන පනත (2013.11.21 දිනැති අංක 1837/30 දරන ගැසට් නිවේදනය) - දේශීයව අගය එකතු කළ නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම සඳහා කිරි නිෂ්පාදන, එළවළු නිෂ්පාදන, ගෘහ භාණ්ඩ ආදිය සඳහා වන සෙස් බද්ද සංශෝධනය කිරීම. ජාත්‍යන්තර වෙළඳපලට ඉහළ තත්ත්වයේ භාණ්ඩ ඉදිරිපත් කිරීම ප්‍රවර්ධනය සඳහා කලාත්මක පෑන්, ටයි පටි සහ බෝ (bows) සඳහා සෙස් බදු ඉවත් කිරීම.

- 1979 අංක 40 දරන අපනයන සංවර්ධන පනත (2013.11.21 දිනැති අංක 1837/31 දරන ගැසට් නිවේදනය) - දේශීයව අගය එකතු කළ නිෂ්පාදන අපනයනය අධෛර්යමත් කිරීම සඳහා ගම්මිරිස්, කුරුඳු, කරාබු නැටි සහ සාදික්කා අපනයන සඳහා සෙස් බදු හඳුන්වාදීම.

**(iii) සුරාබදු**

- අංක 957 දරන සුරාබදු නිවේදනය (2013.04.03 දිනැති අංක 1804/16 දරන ගැසට් නිවේදනය) - රජය විසින් අනුමත කරන ලද පර්යේෂණ හා අධ්‍යාපනික ආයතන, රෝහල් සහ රජයේ දෙපාර්තමේන්තු මගින් යොදා ගනු ලබන (ඊතයිල් මධ්‍යසාර) ස්ප්‍රීතු, අවසන් නිපැයුම සුරාබද්ද ගෙවීමට යටත් නොවන, ඖෂධ හා කාර්මික නිෂ්පාදන සඳහා යොදා ගනු ලබන (ඊතයිල් මධ්‍යසාර) ස්ප්‍රීතු, මත්පැන් නිෂ්පාදනය සඳහා යොදා ගනු ලබන (ඊතයිල් මධ්‍යසාර) ස්ප්‍රීතු සහ අශුද්ධ ඊතයිල් මධ්‍යසාර ස්ප්‍රීතු (කාර්මික ස්ප්‍රීතු/ දූර්වල ස්ප්‍රීතු) සඳහා ආනයනයේදී හා දේශීයව සැපයීමේදී වන නිෂ්පාදන බද්ද සංශෝධනය කිරීම. *

- අංක 958 දරන සුරාබදු නිවේදනය (2013.07.29 දිනැති අංක 1821/3 දරන ගැසට් නිවේදනය) - ගැසට් නිවේදනයේ උපලේඛනයෙහි විශේෂිතව දක්වා ඇති, රජය විසින් අනුමත කරන ලද පර්යේෂණ හා අධ්‍යාපනික ආයතන, රෝහල් සහ රජයේ දෙපාර්තමේන්තු මගින් යොදා ගනු ලබන (ඊතයිල් මධ්‍යසාර) ස්ප්‍රීතු මසකට ලීටර් 20,000 දක්වා, අවසන් නිපැයුම සුරාබද්ද ගෙවීමට යටත් නොවන, ඖෂධ හා කාර්මික නිෂ්පාදන සඳහා යොදා ගනු ලබන (ඊතයිල් මධ්‍යසාර) ස්ප්‍රීතු මසකට ලීටර් 20,000 ක් දක්වා, මත්පැන් නිෂ්පාදනය සඳහා යොදා ගනු ලබන (ඊතයිල් මධ්‍යසාර) ස්ප්‍රීතු හා අශුද්ධ ඊතයිල් මධ්‍යසාර ස්ප්‍රීතු (කාර්මික ස්ප්‍රීතු/දුර්වල ස්ප්‍රීතු සඳහා) සෑම ලීටරයකටම අදාළ බද්ද ඉහළ දැමීම.

- අංක 959, 960 හා 961 දරන සුරාබදු නිවේදන (2013.07.29 දිනැති අංක 1821/4 දරන ගැසට් නිවේදනය) - 2013/07/31 දින සිට බලපැවැත්වෙන පරිදි, ඉක්ෂුපාක, තල්, පොල් සහ පදම් කළ අරක්කු සම්මත සැර ලීටරයක් වෙනුවෙන් වන බද්ද රු. 1,043.00 සිට රු. 1,110.00 දක්වාද, ශ්‍රී ලංකාව තුල නිපදවනු ලබන මෙරට සෑදූ විදේශීය ස්ප්‍රීතු සම්මත සැර ලීටරයක් සඳහා වන බද්ද රු. 1,183.00 සිට රු. 1,250.00 දක්වාද, නිරපේක්ෂ සැර සියයට 5 ට වඩා අඩු ධාන්‍ය මත්පැන් සඳහා බද්ද සෑම ලීටරයකටම රු, 100.00 සිට රු. 110.00 දක්වා සහ නිරපේක්ෂ සැර සියයට 5 ක් සහ ඊට වැඩි ධාන්‍ය මත්පැන් සඳහා බද්ද සෑම ලීටරයකටම රු, 116.00 සිට රු. 130.00 දක්වාද ඉහළ දැමීම. *

**(iv) වරාය සහ ගුවන්තොටුපල සංවර්ධන බද්ද**

- 2011 අංක 18 දරන වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බදු පනත (2013.11.22 දිනැති අංක 1837/46 දරන ගැසට් නිවේදනය) - පැට්‍රෝලියම් තෙල් වර්ග සහ ගැල්තීලමය ඛනිජ වර්ගයන්ගෙන් ලබාගත් තෙල් වර්ග, නිශ්චිතව දක්වා ඇති සංයෝජිත වර්ගීකරණ සංකේතාංක යටතේ ආනයනය කරනු ලබන භාණ්ඩ, ප්‍රතිකාර සඳහා යොදා ගන්නා කුඩුකළ හෝ නොකළ, වියලු, ග්‍රන්ථීන් සහ අනෙකුත් ඉන්ද්‍රියයන්; ප්‍රතිකාර සඳහා යොදා ගන්නා ග්‍රන්ථීන්ගේ හෝ අනෙකුත් ඉන්ද්‍රියයන්ගේ සාරක හෝ ඒවායේ ශ්‍රාවයන්, මිනිස් රුධිරය, ප්‍රතිකාර නිවාරණ හෝ රෝග හඳුනා ගැනීමේ කටයුතු වලට යොදා ගැනීම සඳහා සකස් කළ සත්ත්ව රුධිර වර්ග, ප්‍රතිශක්තිකරණ නිෂ්පාදන, ඖෂධ (ශීර්ෂ 30.02, 30.05 හෝ 30.06 හි අන්තර්ගත භාණ්ඩ හැර) ගුවන් යානා ගුවන්ගත කිරීමේ උපකරණ; ඩෙක්-ඇරෙස්ටර් හෝ ඒ හා සමාන උපකරණ ආනයනයේදී යනාදිය වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බද්දෙන් නිදහස් කිරීම.

**(v) මුදල් පනත යටතේ නිවේදන**

- 2012 අංක 12 දරන මුදල් පනත (2013.07.11 දිනැති අංක 1818/30 දරන ගැසට් නිවේදනය) - 2013 අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීමට අදාළ පහත කටයුතු සඳහා ඉඩකඩ සැලසීම

  (අ) මාර්ගෝපදේශ හා අනුමැතීන් ලබා දෙනු ලබන පදනමක් ඇති කිරීම සඳහා රෙගුලාසි ප්‍රකාශයට පත්කිරීම,

  (ආ) ලබාදීමට නියමිත නිදහස් කිරීම් වල විෂය පථය තීරණය කිරීම සහ

  (ඇ) පනත යටතට ගැනීමට යෝජිත අදාළ විෂය පථයන් ප්‍රකාශයට පත්කිරීම

  මෙම ගැසට් පත්‍රය මගින් සිදු කරනු ලැබේ.

මෙහි මූලික අරමුණ වන්නේ නිදහස් වරායන් සහ බන්ධිත ප්‍රදේශ තුළට ව්‍යාපාර කටයුතු පුළුල් කිරීම හා ආයෝජන දිරිගැන්වීමයි.

මෙම ගැසට් නිවේදනය මඟින් ව්‍යවසායන් විසින් ආයෝජන මණ්ඩලය සමඟ ඇතුලත්වීමට නියමිත ගිවිසුම්වලට අදාළ විධිවිධාන, එකී ව්‍යවසායන් සඳහා අනුමත ව්‍යාපාර කටයුතු, ආයෝජන නියමයන් හා අදාළ විධිවිධාන, බදු නිදහස් කිරීම සම්බන්ධ නියමයන් හා නිදහස් වරාය හා විශේෂිත බන්ධිත ප්‍රදේශ සඳහා නියමයන් ප්‍රකාශයට පත් කර ඇත.

- 2013 අංක 12 දරන මුදල් පනත (2013.08.23 දිනැති අංක 1824/23 දරන ගැසට් නිවේදනය) - ගැසට් නිවේදනය යටතේ නිශ්චිතව සඳහන් බැංකු, මූල්‍ය සමාගම් හා රක්ෂණ ආයතන සඳහා එවැනි ආයතනවල බදු අයකිරීමෙන් පසු ලාභයෙන් සියයට එකක බෝග රක්ෂණ බද්දක් පැනවීම. මෙම බද්ද මඟින් ලැබෙන ආදායම නියඟය, ගංවතුර හා වන අලින්ගෙන් සිදුවන වගා ආපදා සඳහා ගොවි ජනතාව වෙත වන්දි වශයෙන් ගෙවීමට යොදා ගනු ලබයි.

**(vi) මුද්දර බදු (විශේෂ විධිවිධාන) පනත**

- 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ 3 වන වගන්තිය යටතේ නියමය (2013.05.10 දිනැති අංක 1809/19 දරන ගැසට් නිවේදනය) - දිවුරුම් පෙත්සමක් සඳහා අදාළ වන මුද්දර ගාස්තුව රු.250/- සිට රු. 50 දක්වා අඩු කිරීම.

**(vii) දේශීය ආදායම් පනත**

- 2006 අංක 10 දරන දේශීය ආදයම් පනත (2013.12.08 දිනැති අංක 1823/5 දරන ගැසට් නිවේදනය) - අන්තර්ජාතික ගණුදෙනු සම්බන්ධ මිල පැවරුම් නියෝග සහ අන්තර්ජාතික ගණුදෙනු හැර අනෙකුත් ගණුදෙනු සම්බන්ධ මිල පැවරුම් නියෝග සංශෝධනය කිරීම.

- 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත (2013.09.17 දිනැති අංක 1828/9 දරන ගැසට් නිවේදනය) - ආදායම් මත වූ බදු සම්බන්ධයෙන් ද්විත්ව බදුකරණය වැළැක්වීම සහ බදු පැහැර හැරීම වැළැක්වීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ ඉන්දියාව අතර ඇති කරගත් ගිවිසුම ප්‍රකාශයට පත්කිරීම.

- 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත (2013.11.20 දිනැති අංක 1837/13 දරන ගැසට් නිවේදනය) - ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ බෙලාරුස් ජනරජය අතර ආදායම් මත වූ බදු සම්බන්ධයෙන් ද්විත්ව බදුකරණය වැළැක්වීම සහ බදු නොගෙවා මඟ හැරීම වැළැක්වීම සඳහා වූ ගිවිසුම ප්‍රකාශයට පත් කිරීම.

- 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත (2013.11.20 දිනැති අංක 1837/14 දරන ගැසට් නිවේදනය) - ආදායම් මත වූ බදු සම්බන්ධයෙන් ද්විත්ව බදු අයකිරීම වැළැක්වීම සහ බදු පැහැරහැරීම වැළැක්වීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ සීෂෙල්ස් ජනරජ ආණ්ඩුව අතර ඇති කරගත් ගිවිසුම ප්‍රකාශයට පත්කිරීම.

- 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත (2013.11.26 දිනැති අංක 1838/8 දරන ගැසට් නිවේදනය) - ආදායම් මත වූ බදු සම්බන්ධයෙන්

ද්විත්ව බදුකරණය වැළැක්වීම සහ බදු පැහැර හැරීම වැළැක්වීම සඳහා පලස්තීන රජය සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව අතර ඇති කරගත් ගිවිසුම ප්‍රකාශයට පත්කිරීම.

- 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත (2013.11.26 දිනැති අංක 1838/19 දරන ගැසට් නිවේදනය) - ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ ලක්සම්බර්ග් මහා ආදිපාදි වසමේ ආණ්ඩුව අතර ආදායම් මත සහ ප්‍රාග්ධනය මත වූ බදු සම්බන්ධයෙන් ද්විත්ව බදුකරණය වැළැක්වීම සහ බදු නොගෙවා මඟහැරීම වැළැක්වීම සඳහා වූ සම්මුතිය ප්‍රකාශයට පත්කිරීම.

**(viii) 2003 අංක 03 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම) පනත යටතේ ප්‍රකාශයට පත් කරන ලද ගැසට් නිවේදන**

- 2003 අංක 3 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම) පනතේ 13 වැනි වගන්තිය යටතේ (2013.05.31 දිනැති 1812/28 දරන ගැසට් නිවේදනය) - මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ 2012 වාර්ෂික වාර්තාව ප්‍රකාශයට පත් කිරීම.

- 2003 අංක 3 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම) පනතේ 10 වැනි වගන්තිය යටතේ (2013.07.02 දිනැති 1817/27 දරන ගැසට් නිවේදනය) - 2013 වසර මැද රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව ප්‍රකාශයට පත් කිරීම

- 2003 අංක 3 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම) පනතේ 4 සහ 7 වැනි වගන්තිය යටතේ (2013.11.21 දිනැති 1837/32 දරන ගැසට් නිවේදනය) - 2014 රාජ්‍ය මූල්‍ය කළමනාකරණ වාර්තාව ප්‍රකාශයට පත් කිරීම

**2.3.2. මෙම දෙපාර්තමේන්තුව විසින් 2013 වසරේදී සිදු කරන ලද පනත් සංශෝධන**

- 2013 අංක 17 දරන එකතුකළ අගය මත බදු (සංශෝධන) පනත
- 2013 අංක 18 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත
- 2013 අංක 12 දරන මුදල් (සංශෝධන) පනත
- 2013 අංක 11 දරන ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනත
- 2013 අංක 6 දරන ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත
- 2013 අංක 5 දරන වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බදු (සංශෝධන) පනත
- 2013 අංක 7 දරන සුරාබදු (සංශෝධන) පනත
- 2013 අංක 8 දරන විදුලි සංදේශ බදු (සංශෝධන) පනත
- 2013 අංක 13 දරන නොතාරිස් (සංශෝධන) පනත
- 2013 අංක 14 දරන ඇටෝර්නි බලපත්‍ර (සංශෝධන) පනත

- 2013 අංක 15 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම්) (සංශෝධන) පනත
- 2013 අංක 20 දරන බදු අභියාචනා කොමිෂන් සභාව (සංශෝධන) පනත
- 2013 අංක 19 දරන ඔට්ටු ඇල්ලීම හා සූදු බදු (සංශෝධන) පනත
- 2013 අංක 16 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති (සංශෝධන) පනත
- 2013 අංක 21 දරන ලේඛන ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත
- 2013 අංක 22 දරන විවාහ ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත
- 2013 අංක 23 දරන උඩරට විවාහ හා දික්කසාද (සංශෝධන) පනත
- 2013 අංක 24 දරන මුස්ලිම් විවාහ හා දික්කසාද (සංශෝධන) පනත
- 2013 අංක 25 දරන උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත

2.4. රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිමය කරුණු පිළිබඳව ගරු මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමා විසින් 2013 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩල සංදේශ පත්‍රිකා ඉදිරිපත් කරන ලදී. එසේම, රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියට අදාළව ගරු මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගේ නිරීක්ෂණ ලබා දිය යුතු අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ පිළියෙල කිරීම ද මෙම දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලදී.

**2.5. විවිධ බදු සම්බන්ධ පනත් කෙටුම්පත් සහ ගැසට් පත්‍ර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සහ ඊට අනුගාමී ක්‍රියා මාර්ග ගැනීම**

- බදු පිළිබඳ ව්‍යවස්ථාවන් සංශෝධනය කිරීම සම්බන්ධයෙන් මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ නීති කටයුතු දෙපාර්තමේන්තුව, නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව, ගරු නීතිපතිතුමා, දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා, රජයේ මුද්‍රණාලය සහ පාර්ලිමේන්තුව සමග සහයෝගයෙන් කටයුතු කරමින් අදාළ කටයුතු සිදු කරන ලදී.
- බදු/ගාස්තු ප්‍රතිශෝධනයට අදාළ ගැසට් නිවේදනයන් 2013 වසර තුළ ප්‍රකාශයට පත් කරන ලදී.

**2.6 සියලු ආදායම් ප්‍රභවයන් සමාලෝචනය කිරීම, ආදායම් පිළිබඳ දත්ත එක්රැස් කිරීම හා පිළියෙල කිරීම, ආදායම් ඇස්තමේන්තු හා මුදල් ප්‍රවාහ තත්ත්වය අධීක්ෂණය කිරීම.**

- 2013 වර්ෂය සඳහා නියමිත ආදායම් ඇස්තමේන්තු, ආදායම් රැස්කිරීමේ දෙපාර්තමේන්තු හා සම්බන්ධ වී සකස් කරන ලදී.
- භාණ්ඩාගාර ලේකම්වරයා, භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්වරුන්, භාණ්ඩාගාර දෙපාර්තමේන්තු ප්‍රධානීන්, ආදායම් රැස්කරන දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් සහ අනෙකුත් අදාළ ආයතනවල සහභාගිත්වයෙන් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති කමිටුවෙහි රැස්වීම් හතරක් (කාර්තුමය වශයෙන්) පවත්වන ලදී.

- ආදායම් රැස්කිරීමේ ප්‍රගතිය මාසික ආදායම් වාර්තා මගින් සහ විශේෂ තොරතුරු ලබා ගැනීම මගින් ද අධීක්ෂණය කළ අතර, ප්‍රතිපත්ති තීරණ ගැනීම සඳහා අවශ්‍යවන කාර්යසාධනය විශ්ලේෂණය කිරීමද සිදු කරන ලදී.

**2.7 2003 අංක 03 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම) පනත යටතේ අදාළ වාර්තා ප්‍රකාශයට පත් කිරීම.**

- **වාර්ෂික වාර්තාව 2012**

  2003 අංක 03 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම) පනතේ 13 වන වගන්තිය යටතේ මුදල් වර්ෂය අවසාන වී මාස පහක් ඉක්මවා යාමට මත්තෙන් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර මහජනතාවට නිකුත් කළ යුතු අවසාන අයවැය තත්ත්වය පිළිබඳ වාර්තාව එනම් 2012 වාර්ෂික වාර්තාව, 2013 මැයි මස දී ප්‍රකාශයට පත් කෙරිණි.

- **වසර මැද රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව - 2013**

  2003 අංක 03 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම) පනතේ 10 වන වගන්තිය යටතේ ප්‍රකාශයට පත් කළ යුතු මෙම වාර්තාව අදාළ වර්ෂයේ ජූනි මස අවසාන දිනට හෝ විසර්ජන පනත සම්මත වීමෙන් මාස හයක් ඉක්ම යාමට පෙර යන කාල පරිච්ඡේද දෙකෙන් පසුව එළඹෙන දිනට ප්‍රථම, සෑම වසරකම නිකුත් කළ යුතු අතර, 2013 වසර මැද රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව 2013 ජූනි මස ප්‍රකාශයට පත් කරන ලදී.

- **රාජ්‍ය මූල්‍ය කළමනාකරණ වාර්තාව - 2013**

  2003 අංක 03 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම) පනතේ 4, 5 සහ 6 වන වගන්ති යටතේ ඉදිරිපත් කෙරෙන රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය වාර්තාව 2013 සහ 7, 8 සහ 9 වන වගන්ති යටතේ ඉදිරිපත් කළ යුතු අයවැය, ආර්ථිකය සහ රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව 2013 යන වාර්තා දෙකෙන් සමන්විත රාජ්‍ය මූල්‍ය කළමනාකරණ වාර්තාව 2013 නොවැම්බර් මස ප්‍රකාශයට පත් කරන ලදී.

## 3. පාලන හා ගිණුම්

### 3.1. සංවිධාන ව්‍යුහය

රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය 65 කින් සමන්විත වේ. ඒ අනුව පහත සඳහන් කාර්ය මණ්ඩලය මෙම දෙපාර්තමේන්තුව යටතේ සේවහ කරයි.

**කාර්ය මණ්ඩල විස්තර - 2013 (2013.12.31 දිනට)**

| තනතුර | අනුමත තනතුරු සංඛ්‍යාව | දැනට පුරවා ඇති සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| අධ්‍යක්ෂ ජනරාල් | 01 | 01* | - |
| අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | 01 | | 01 |
| අධ්‍යක්ෂ<br>ශ්‍රී. ලං. ප. සේ. | 02 | 01 | 01 |
| ශ්‍රී. ලං. ක්‍රා. සේ. | 01 | 01*** | - |
| ජ්‍යෙෂ්ඨ ආර්ථික විද්‍යාඥ | 01 | - | 01 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ - ශ්‍රී. ලං. ප. සේ. | 09 | 04 + 01** + 01*** | 03 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ - ශ්‍රී. ලං. ක්‍රා. සේ. | 04 | 04 | - |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ - ශ්‍රී. ලං. ග. සේ. | 01 | 01 | - |
| ආර්ථික විද්‍යාඥ | 01 | - | 01 |
| සංඛ්‍යාලේඛනඥ | 01 | - | 01 |
| පරිපාලන නිලධාරි | 01 | 01 | - |
| භාෂා පරිවර්තක | 02 | 01 | 01 |
| පර්යේෂණ සහකාර | 06 | 03 | 03 |
| සංවර්ධන සහකාර | 06 | 03 | 03 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 13 | 07 | 06 |
| රියැදුරු | 06 | 03 | 03 |
| කා.කා.ස | 09 | 07 | 02 |
| **එකතුව** | **65** | **39** | **26** |

* ශ්‍රී ලංකා මහ බැංකුවේ මාණ්ඩලික නිලධාරියකු අධ්‍යක්ෂ ජනරාල් ලෙස සේවය කරනු ලබයි.

** දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ තක්සේරු නිලධාරියෙකු නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරක ක්‍රියා කරනු ලැබේ.

*** එතෙර අධ්‍යාපන නිවාඩු ලබා ඇත.

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් අනුයුක්තව සිටින බදු උපදේශකවරියක ගේ සේවය ද මෙම දෙපාර්තමේන්තුවට ලැබේ.

## 3.2 මානව සම්පත් සංවර්ධනය

දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයට ඔවුන්ගේ වෘත්තීය කුසලතා සහ දැනුම වැඩි දියුණු කර ගැනීමට අවස්ථාව සැලසීම සඳහා විදේශ ශිෂ්‍යත්ව සහ දේශීය පුහුණු පාඨමාලාවන් සඳහා සහභාගී කර වූ අතර ඒ තුළින් ඔවුන්ගේ ඵලදායීතාව වැඩි දියුණු වීම හේතුවෙන් දෙපාර්තමේන්තුවේ කටයුතු කාර්යයක්ෂමව කරගෙන යාම අපේක්ෂා කෙරේ. කාර්ය මණ්ඩලය සඳහා 2013 දී ලබා දෙන ලද දේශීය හා විදේශීය පුහුණුවීම් පිළිබඳ විස්තර පහත සඳහන් වේ.

### 3.2.1 කාර්ය මණ්ඩල පුහුණු කිරීම

**(අ) දේශීය පුහුණුවීම්**

| නම | තනතුර | පුහුණු ආයතනය සහ වැඩසටහන | පුහුණු කාලය |
|---|---|---|---|
| ජේ.එම්. එස්.එන්.ජයසිංහ මහතා | අධ්‍යක්ෂ | මිලෝදා ආයතනය - Seminar on Public Financial Management | 2013 අප්‍රේල් 22 සිට 24 දක්වා |
| කේ. ඒ. රම්‍යා කාන්ති මෙනවිය | අධ්‍යක්ෂ | CBS ආයතනය - Treasury & Foreign Exchange Operations | 2013 ජූලි 29 සිට අගෝස්තු 01 දක්වා |
| එස්.පී. කිරිවත්තුඩුවගේ මහතා | සහකාර අධ්‍යක්ෂ | Fiscal Management Efficiency Project - Capacity Building Program on ITMIS | 2013 පෙබරවාරි 26 |
| ඩබ්.එච්.ඒ. විමලජීව මිය | සහකාර අධ්‍යක්ෂ | Chartered Institute of Public Finance & Accountancy (CIPFA) London - Awareness Programme on Sri Lanka Public Sector Accounting Standards | 2013 ජූනි 10 |
| | | ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය - 33rd National Conference of Institute of Chartered Accountants of Sri Lanka | 2013 ඔක්තෝබර් 24 සිට 26 දක්වා |
| ඒ. ඩබ්. එම්. ඒ. අනුරාධ තිලකරත්න මහතා | සහකාර අධ්‍යක්ෂ | Fiscal Management Efficiency Project - Capacity Building Program on ITMIS | 2013 පෙබරවාරි 26 |
| එම්.ඒ.එන්. සී. පෙරේරා මිය | සහකාර අධ්‍යක්ෂ | ප්‍රාග් ආයතනය - VAT & SVAT | 2013 ජූලි 19 |
| එච්.ඩී.ඒ. රුක්ෂිණී මෙනවිය | සහකාර අධ්‍යක්ෂ | මිලෝදා ආයතනය - Seminar on Public Financial Management | 2013 අප්‍රේල් 22 සහ 24 |

| | | | |
|---|---|---|---|
| | | ප්‍රාග් ආයතනය - VAT & SVAT | 2013 ජූලි 19 |
| එච්. එෆ්. පී. ෆොන්සේකා මිය | පරිපාලන නිලධාරී | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය - විනය කාර්ය පරිපාටිය | 2013 අප්‍රේල් 22, 23 සහ 24 දක්වා |
| සී. කේ. විතාන මිය | සංවර්ධන සහකාර | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය - Certificate Course in English for Employment Purposes (CEEP) - 2013 | 2013 මැයි 12 සිට සති 10ක් (සෑම සතියකම බ්‍රහස්පතින්දා දින) |
| ඩබ්.එම්.එම්.පී. පෙරේරා මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය - Certificate Course in English for Employment Purposes (CEEP) - 2013 | 2013 මැයි 12 සිට සති 10ක් (සෑම සතියකම බ්‍රහස්පතින්දා දින) |
| ටී.පී. ආරියතිලක මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය - Certificate Course in English for Employment Purposes (CEEP) - 2013 | 2013 මැයි 12 සිට සති 10ක් (සෑම සතියකම බ්‍රහස්පතින්දා දින) |
| එස්.ඩබ්.එස්. එන්. දිලන්තිකා මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය - Certificate Course in English for Employment Purposes (CEEP) - 2013 | 2013 මැයි 12 සිට සති 10ක් (සෑම සතියකම බ්‍රහස්පතින්දා දින) |
| | | SDFL - කාර්යාල ක්‍රම සහ කාර්යාල කළමනාකරණය | 2013 නොවැම්බර් 26 සහ 27 |
| ඒ.ඩී. උඩුගහපත්තුව මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | SDFL - කාර්යාල ක්‍රමවේදය | 2013 ජූනි 25 සහ 26 |
| | | SDFL - කාර්යාල ක්‍රම සහ කාර්යාල කළමනාකරණය | 2013 නොවැම්බර් 26 සහ 27 |
| සී.වයි. රණසිංහ මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය - Certificate Course in English for Employment Purposes (CEEP) - 2013 | 2013 මැයි 12 සිට සති 10ක් (සෑම සතියකම බ්‍රහස්පතින්දා දින) |
| ඇන්. ඒ. ස්වර්ණලතා මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව - Public Sector Accounting Software | 2013 ජූනි 24 |
| ඩබ්.එන්.ඩී. සිල්වා මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | SDFL - Annual Stock Verification & Disposal Proceduers | 2013 අගෝස්තු 12 සහ 13 |
| | | SDFL - කාර්යාල ක්‍රම සහ කාර්යාල කළමනාකරණය | 2013 නොවැම්බර් 26 සහ 27 |

### 3.2.2. විදේශීය පුහුණුවීම් /වැඩමුළු

| නම | තනතුර | පුහුණු ආයතනය සහ වැඩසටහන | පුහුණු කාලය |
|---|---|---|---|
| කේ. එම්. මහින්ද සිරිවර්ධන මහතා | අධ්‍යක්ෂ ජනරාල් | IMF - IMF/WB Spring Meetings in Washington DC, USA | 2013 අප්‍රේල් 16 සිට 23 දක්වා |
| | | SAARC Finance Group Meeting & Governor's Symposium, Islamabad, Pakistan | 2013 ජූනි 17 සිට 25 දක්වා |
| | | National University of Singapore - Training Program on E-Governance and Change Management for Senior Level | 2013 අගෝස්තු 17 සිට 25 දක්වා |
| ඩී. ජී. පී. ඩබ්. ගුණතිලක මෙනවිය | බදු උපදේශක | Kuala Lumpur, Malaysia - IRMB - OECD Tax Policy Analysis | 2013 පෙබරවාරි 18 සිට 22 දක්වා |
| | | National University of Singapore - Training Program on E-Governance and Change Management for Senior Level | 2013 අප්‍රේල් 20 සිට 28 දක්වා |
| කේ. ඒ. රම්‍යා කාන්ති මෙය. | අධ්‍යක්ෂ | National University of Singapore - Executive Training Program | 2013 ජූලි 01 සිට 05 දක්වා |
| | | USA Treasury Department - International Visitor Leadership Program in USA on " Taxation: Granting Funds" | 2013 සැප්තැම්බර් 09 සිට 13 දක්වා |
| එච්. එස්. එස්. කුමාර මහතා | සහකාර අධ්‍යක්ෂ | IMF - Singapore Training Center - Macroeconomic Diagnostic | 2013 මාර්තු 03 සිට 15 දක්වා |
| | | ADB HQ in Manila, Phillipines - An International Forum on Skills for Inclusive and Sustainable Growth in Developing Asia Pacific | 2013 දෙසැම්බර් 09 සිට 13 දක්වා |
| එස්. පී. කිරිවත්තුඩුවගේ මහතා | සහකාර අධ්‍යක්ෂ | Asian Development Bank - 46th Annual Meeting of the Board of Governors - Delhi , India | 2013 මැයි 02 සිට 05 දක්වා |
| | | National University of Singapore - Executive Training Program | 2013 ජූලි 01 සිට 05 දක්වා |

| | | | |
|---|---|---|---|
| එම්.ඒ.එන්.සී. සෙනවිරත්න මිය | සහකාර අධ්‍යක්ෂ | JDS, Japan - Macro Economics and Development Economics | 2013 අගෝස්තු 22 සිට 2015 ඔක්තෝම්බර් දක්වා |
| ඒ.ඩබ්.එම්.ඒ.අනුරාධ තිලකරත්න මහතා | සහකාර අධ්‍යක්ෂ | IMF - Fourth High Level Tax Conference for Asian Countries in Tokyo, Japan | 2013 අප්‍රේල් 01 සිට 05 දක්වා |
| | | National University of Singapore - Executive Training Program | 2013 ජූලි 01 සිට 05 දක්වා |
| | | Minsk, Belarus - Proposed Negotiation on the Draft Agreement for Avoidence of Double Taxation and Prevention of Fiscal Evasion | 2013 අගෝස්තු 05 සිට 09 දක්වා |
| | | Singapore - Negotiation on Avoidence & Doulbe Taxation | 2013 ඔක්තෝම්බර් 21 සිට 25 දක්වා |
| එම්.කේ.සී. සේනානායක මහතා | සහකාර අධ්‍යක්ෂ | Ph.D. Programme in Economics at the University of New South Wales -Australia | 2011 ජනවාරි සිට 2014 දෙසැම්බර් 04 දක්වා |
| එච්. ඩී. ඒ. රුක්ෂිණී | සහකාර අධ්‍යක්ෂ | KOICA - Korea- Knowledge Sharing Program (KSP) of Korea Interim Report Workshop | 2013 ජනවාරි 14 සිට 20 දක්වා |
| | | Warsaw, Poland - Negotiation for the revision of the Agreement on the Avoidence of Double Taxation and the Prevention of Fiscal Evasion | 2013 නොවැම්බර් 30 සිට දෙසැම්බර් 08 දක්වා |

### 3.3. මූල්‍ය පරිපාලනය

2013 වර්ෂය සඳහා 238 ශීර්ෂය යටතේ මෙම දෙපාර්තමේන්තුවට අයවැය ඇස්තමේන්තුව මගින් ප්‍රතිපාදන වෙන් කර දී තිබූ අතර එම ප්‍රතිපාදන යොදාගත් ආකාරය පහත දැක්වේ.

**(i) 2013 අයවැය ප්‍රතිපාදන යොදා ගත් ආකාරය**

| වියදම් විස්තරය | 2013 ඇස්තමේන්තුව රුපියල් | 2013 ශුද්ධ ප්‍රතිපාදන රුපියල් | 2013 තථ්‍ය වියදම රුපියල් |
|---|---|---|---|
| **පුනරාවර්තන වියදම්** | **98,625,000** | **97,425,000** | **68,356,153.58** |
| පුද්ගල පඩිනඩි | 25,600,000 | 26,250,000 | 20,764,926.17 |
| ගමන් වියදම් | 1,100,000 | 3,300,000 | 3,266,465.81 |
| සැපයීම් | 2,475,000 | 2,475,000 | 1,806,287.05 |
| නඩත්තු වියදම් | 2,400,000 | 2,430,000 | 1,791,829.14 |

| | | | |
|---|---|---|---|
| ගිවිසුම්ගත සේවා | 66,700,000 | 62,620,000 | 40,400,979.28 |
| මාරු කිරීම් හා වෙනත් | 350,000 | 350,000 | 325,666.13 |
| **මූලධන වියදම්** | **900,000** | **2,100,000** | **1,855,424.76** |
| පුනරුත්ථාපන හා වැඩිදියුණු කිරීම් | 100,000 | 200,000 | 127,395.00 |
| අත්පත්කර ගැනීම් | 500,000 | 1,500,000 | 1,360,029.76 |
| ප්‍රාග්ධන මාරුකිරීම් | - | - | - |
| හැකියා වර්ධනය | 300,000 | 400,000 | 368,000.00 |
| **මුළු එකතුව** | **99,525,000** | **99,525,000** | **70,211,578.34** |

**(ii) රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම**

2013 වර්ෂය සඳහා මෙම දෙපාර්තමේන්තුවේ රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුමේ විස්තර පහත දැක්වේ.

| විස්තරය | අනුමත සීමාව රුපියල් | තථ්‍ය සීමාව රුපියල් |
|---|---|---|
| 1. උපරිම වියදම් සීමාව | 3,000,000.00 | 1,222,471.00 |
| 2. අවම ලැබීම් සීමාව | 1,000,000.00 | 1,169,046.11 |
| 3. උපරිම හර ශේෂ සීමාව | 10,000,000.00 | 6,270,720.99 |

**විගණන විමසුම්**

2013 වර්ෂය තුළ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කළ විගණන විමසුම් 04කට සහ විගණකාධිපති දෙපාර්තමේන්තුවෙන් ලද විගණන විමසුම් 03 සඳහා පිළිතුරු ලබාදී ඇත.